# වැවිලි අමාත්‍යාංශය

## ජනතා වතු සංවර්ධන මණ්ඩලය

## ඇබෑර්තු

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින සාමාන්‍යාධිකාරී තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා ලද අයදුම්කරුවන් රජය විසින් නිකුත් කරන ලද හා ඉදිරියේදී නිකුත් කිරීමට අපේක්ෂිත අණ පණත් හා ආයතනික නීති රීති, රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව තනතුරට අදාල කාර්යයන් ඉටුකිරීමට මනා හැකියාවක් ඇති අය විය යුතුය.

<u>සාමාන්‍යාධිකාරී</u>

ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දෙනු ලබන බලතල, කාර්යයන් හා වගකීම් එම අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම හා පරිපාලනය යටතේ ඉටුකරමින් ආයතනික කාර්ය මණ්ඩලයට නායකත්වය දෙමින් ද කාර්ය මණ්ඩලය දිරිගන්වමින් ද ආයතනය ඉහලම ඵලදායීතාව කෙරෙහි යොමුකරවීම ද ආයතනයෙහි සමස්ථ කාර්ය සාධනය සම්බන්ධයෙන් මූලික වගකීම හා වගවීම දැරීම ද සාමාන්‍යාධිකාරී තනතුර දරණ අයට පැවරෙන කාර්ය භාරය වේ.

*<u>සුදුසුකම් හා පලපුරුද්ද</u>*

බාහිර අයදුම්කරුවන්

(අ) කෘෂිකර්මය / විද්‍යාවේදී කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

කෘෂිකර්මය / විද්‍යාවේදී කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර **20** ක පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර **05** ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.)

හෝ

(ආ) කෘෂිකර්මය / විද්‍යාවේදී කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

කෘෂිකර්මය / විද්‍යාවේදී කළමනාකරණ හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

ආචාර්ය උපාධියක් ලබාගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර **05** ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද.

| | | |
|---|---|---|
| සේවා ශ්‍රේණිය | : | "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" |
| වැටුප් තලය | : | **HM 2-1 (රු.91,645 - 12 x 2,700 - 124,045)**<br>හා ජීවන වියදම් දීමනාව |
| වයස | : | අවු: **35** ට නොඅඩු හා අවු: **55** ට නොවැඩි විය යුතුය. |

දිප ව්‍යාප්ත සේවාවේ I වන පන්තියේ නිලධාරීන් අයදුම්කරන්නේ නම්, අන්තර්ග්‍රහනය කිරීමේ පදනම මත බඳවැගැනීමේ පටිපාටියේදී ප්‍රමුඛතාවය දෙනු ලැබේ.